# කන්නෙට ගොවිතැන් කරමු

කන්නෙට ගොවිතැන් කලාම
කෘමි රෝගත් අඩු වෙනවා
වනාත පිටි එළිකලාම
කළ එලියත් වැඩිවෙනවා

හානිවලට ඔරොත්තු දෙන
වී අරගෙන වපුරන්න
ඇළ වේලිද පිරිසිදු කර
වතුර යසට ගෙන යන්න

බිත්තර වී ටික පොලලා
බොල්වල් ඇට ඉවත හෙලා
පිරිසිදු වී ටික පමණක්
කුඹුරට පදමට ඉසින්න

සුදුසු කලට නිසි පදමට
"වල්තෙල්" ටික ඉසිනු මැනව
වැඩිය නැතිව අවැසි තරම
කලට පොහොර යොදනු මැනව

ගොයමට වින දෙන සතුරෝ
කිඩෑ ගොක් මැසි මැස්සෝ
පුරුක් පනුවෝ - පැල මැක්කෝ
ගොවියගේ කවදත් සතුරෝ

උන් වනසන්නට ගොයමේ
ඇත තව කොටසක් එබිමේ
මුදලක් නැත වැය වන්නේ
එසැම රැකුම යුතුවන්නේ

ඉබි කුරුමිණි බත් කුරන්
රතු කඩියන් - රතු කාවන්
ජල පදිකයෝ දිය මත්තෙන්
මකුළුවෝ අපේ හිත මිතුරන්

ගොයමට ඉස්සොත් "වස විස"
මිය යති මේ හැම විගසින
ගොවි මහතුනි මෙය සිහිකර
හිතන්න "තෙල්" ඉසිනට පෙර

මේ සැම කලහොත් මුල සිට
රන් අස්වනු පැහෙයි ජයට
ගෙන ගොස් අස්වනු ගෙදරට
මේ ටික කල යුතුය මිතුර

කමතේ ඇති පිදුරු ගොඩට
නොතබනු ගිනි දැල් වෙන්නට
අතුරාලා ඔබේ කෙතට
සලකනු බත දුන් පොළවට

රංජිත් නානායක්කාර
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ රූපවාහිනී
හා ගුවන් විදුලි ගොවි සේවාව
රජරට ඒකකය
අනුරාධපුරය.